10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 08 පාඩම

සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 8 පාඩම

# අනුසස් දැක සිල්වත් වෙමු

# අනුසස් දැක සිල්වත් වෙමු

**සීලය යනු....**

- කාය වාචානං සමෝදානං සීලං

(කය වචන දෙකෙහි සංවරකම ශීලය යි)

# ශීලයෙහි ප්‍රධාන ප්‍රභේද දෙකකි

1. සමාදානය :-

    කළ යුතු දේ හෙවත් සිරිත්

2. විරමණය :-

    නොකළ යුතු දේ හෙවත් විරිත්

# සිල් රැකීමෙන් ලැබෙන ප්‍රධාන ආනිසංස පහක්

1. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම
2. කීර්තිය පැතිරීම
3. ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකි වීම
4. සිහි මුලා නොවී කළුරිය කිරීම
5. මරණින් මතු සුගතියෙහි උපත ලැබීම

# 01 සිල් රැකීමෙන් මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගත හැකි ආකාරය

- සිල්වත් පුද්ගලයා නිරන්තරයෙන් උද්යෝගිමත් ව අප්‍රමාදී ව ක්‍රියාකරන බැවින් මහත් වූ භෝග සම්පත් වල හිමි කරුවෙකු වේ.
- සිල්වත් පුද්ගලයා භෝග විනාශයට හේතු වන දුසිරිතෙන් වැළකී සුසිරිතෙහි යෙදෙන බැවින් භෝග සම්පත් වල හිමි කරුවෙකු වේ.

# සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන භෝග විනාශයට හේතුවන කරුණු හය

1. මදයට හා ප්‍රමාදයට හේතුවන මද්‍යසාර භාවිතය
2. නුසුදුසු වේලාවන්හි මංමාවත්වල සැරිසැරීම
3. නැටුම් ගැයුම් වැයුම් හී ලොල් බව
4. සූදුවෙහි යෙදීම
5. පවිටු මිතුරන් ඇසුර
6. අලසකමින් කල් ගෙවීම

# 02. සිල් රැකීමෙන් කීර්තිය පැතිරෙන ආකාරය

- ශීලයෙහි පිහිටා කටයුතු නොකරන පුද්ගලයාට හිමි වන්නේ අපකීර්තිය යි.
- පරපණ නොනසන, සොරකමින් වැළකුනු, වැරදි කාම සේවනයෙන් වැළකුනු, බොරුවෙන් තොර, මද්‍යසාරයෙන් වැළකුනු, පුද්ගලයාට කිර්තිය හිමිවෙයි.
- මෙවැනි පුද්ගලයා පිළිබඳව සමාජය ප්‍රශංසනාත්මකව අගය කරයි.

# 03. සිල් රැකීමෙන් ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකි වන ආකාරය

- සතුන් මැරීම, සොරකම් කිරීම ආදී පඤ්ච දුශ්චරිතයෙහි නොයෙදෙන බැවින් ඔහු තුළ බිය හා සැකය නැත
- තමා සිදු කළ දෑ පිළිබඳව හෘද සාක්ෂියට එකඟව තමා දන්නා බැවින් සභාවක් ඉදිරියේ සෘජුව පෙනී සිටීමේ ආත්ම ශක්තියක් ඔහුට ඇත
- සිල් රකින්නා පඤ්ච දුශ්චරිතයෙහි නොයෙදෙන බැවින් සමාජයේ සාමකාමී බව හා සුභදතාව ආරක්ෂා කරයි

# 04. සිල් රැකීමෙන් සිහි මුලා නොවී කළුරිය කිරීම හැකි බව

- දුසිල්වත් ව කටයුතු කරන්නාගේ මරණාසන්න මොහොත බොහෝ විට බියකරුය.
- සිල්වත්ව ජීවත් වන්නා මරණයට බිය නොවේ. ඔහු තමා සුගතියක උපදින බව දනී.
- මරණාසන්න මොහොතේ තමා කළ හොඳ සිහිපත් වීමෙන් සුගතියම දැක සිහියෙන් යුතුව කළුරිය කරයි.

# 05. සිල් රැකීමෙන් මරණින් මතු සුගතියෙහි උපත ලබන ආකාරය

- අකුසල කර්ම කළ තැනැත්තා මරණින් මතු දුගතියේ උපදින අතර අකුසලයෙන් වැළකී කුසල කර්ම කළ තැනැත්තා මරණින් මතු සුගතිගාමී වේ.
- මේ අනුව පව අකුසලය පිළිකුල් කරමින් එම ක්‍රියා වලට උපන් බිය ඇතිව ජීවත් වන බැවින් ද, පින කුසලය උතුම් කොට සලකමින් එම ක්‍රියාවන්ට යොමු වී සිටින බැවින් ද සිල්වතා සුගතියක ම උප දී.

# පුහුණුවට

යෝ චේ වස්සසතං ජීවේ
දුස්සීලෝ අසමාහිතෝ
ඒකාහං ජීවිතං සෙය්‍යෝ
සීල වන්තස්ස ඣායිනෝ

(ධම්ම පදය - සහස්ස වග්ගය)

දුශ්ශීල ව නොසන්සුන් සිත් ඇති ව අවුරුදු සීයක් ජීවත් වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇති ව එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ ය

# තෙරුවන් සරණයි...!